# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1973/78 - 2016 ජූලි මස 01 වැනි සිකුරාදා - 2016.07.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනත**

09 වැනි වගන්තිය යටතේ කෙරෙන නියෝගය

''මඩකලපුව ගුවන්තොටුපළෙහි මෙහෙයුම සහ නඩත්තුව'' යන මැයෙන් ම විසින් ඉදිරිපත් කරන ලද 2016 මැයි මස 31 දිනැති අංක. 16/1031/709/035-1 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව 2016 ජුනි මස 14 වැනි දින දෙන ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, සිවිල් ගුවන්සේවා විෂය භාර අමාත්‍යවරයා වන නිමල් සිරිපාල ද සිල්වා වන මා විසින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ 9 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව උක්ත පනතේ දෙවන උපලේඛනයේ ගගන යාත්‍රාංගන යටතේ ලේඛනගතව ඇති මඩකලපුව ගුවන්තොටුපළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි පවරා සතුකර දෙන බව මෙයින් දැනුම් දෙමි.

නිමල් සිරිපාල ද සිල්වා,(පා.ම.)
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2016 ජුනි මස 28 වැනි දින,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල,
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ දී ය.

07 - 776

1A - G 23766 — 08 (2016/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*